# 1.11 පාලි සම්ප්‍රදාය තුළ අනුමානයෙහි විවිධ ව්‍යවහාර

පූජ්‍ය විජිතපුර ගුණරතන හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය

## ABSTRACT

අනු+මා (පමාණෙ) මැණීමෙහි (To meter, To measure) ධාතුවෙන් නිපන් පදයක් ලෙස අනුමානය හැඳින්විය හැකිය. එහිදී අනතුරුව මැනීම, පශ්චාත් මානය, දෙයක් අනුව දැනුවත් වීම, අනතුරු විනිශ්චය හෝ දැනුවත් වීම, දැනුවත් කිරීම යනාදී අර්ථ ලැබේ. පූර්ව සාධක අනුව නිගමනයකට එළඹීම හෝ ඒ සඳහා වූ උපාය මාර්ගය මින් අදහස් වේ. අනුමානය සත්‍ය ඥානය සඳහා වූ එක් මාධ්‍යයකි.

අනුමාන යන්න බුදුන් වහන්සේ විසින් "අන්වයෙ ඤාණ" යනුවෙන් හඳුන්වා ඇත. ආර්ය අනුමාන ඥානය ධම්මන්වය යනුවෙන් ද පෙළ සාහිත්‍යයේ දක්නට ලැබේ. අන්‍ය දර්ශන තුළ අනුමානය ස්වාර්ථ-පරාර්ථ යනුයෙන් දෙවැදෑරුම්ය. පෙළෙහි හමුවන අන්වය ඥානය සැසඳිය හැක්කේ ස්වාර්ථානුමානය සමගය. තමා කලින් ලත් ප්‍රත්‍යක්‍ෂයක් අනුව අප්‍රත්‍යක්‍ෂ වස්තුවක් පිළිබඳ නිගමනයක් ඇති කර ගැනීම අන්වය ඥානයයි. මින් අදහස් වන්නේ දන්නා දෙය අනුව නොදන්නා දෙයක් දැන ගැනීමයි. (දිට්ඨෙන අදිට්ඨස්ස අනුමානං හොති) අභිධර්ම පිටකයට අයත් කථාවත්ථුප්පකරණයේ යුත්ති යනුවෙන් දැක්වෙන්නේ ද අනුමානයයි.

තර්ක බුද්ධියෙන් කළ යුතු විනිශ්චය අනුමාන බුද්ධියෙන් සිදු කොට ඇති බවට සාධක මජ්ඣිමනිකායේ අනුමාන සූත්‍රයෙන් හා අනාථපිණ්ඩිකෝවාද සූත්‍රයෙන් ද පෙන්වා දී ඇත. අනුමාන යන්නම සඳහන් නොවුන ද සාධකයක් මගින් කෙරෙන යුක්ති විනිශ්චය නිගමනයකට එළඹීමේ දී වැදගත් වන බව බුදුසමය පෙන්වා දෙයි. මජ්ඣිමනිකායේ ඔපම්ම වර්ගයට අයත් චුල්ලහත්ථිපදොපම සූත්‍රය මේ සඳහා නිදසුනකි. තක්ක, අනුමාන, අන්වය යන මේවා හැර යුක්ති විනිශ්චය වෙනුවෙන් උපමා යොදා ගෙන ඇති බවට සාධක චුල්ලහත්ථිපදොපම සූත්‍රයෙහි දැක්වේ.

මිලින්ද ප්‍රශ්නයේ අනුමාන කාණ්ඩයේ දක්නට ලැබෙන්නේ සාධක මතින් අනුමානය සාධනය කිරීමයි. නිවැරදි යුක්ති විනිශ්චයන් ලබා දෙන්නේ නිශ්චිත සාධක එළවීමෙනි. බුද්ධිමත් පුද්ගලයා නිශ්චිත සාධක තුළින් අනුමානය ඇසුරු කොට යමක් දැනගනී. මේ අනුව අප වර්තමානයේ තර්කය (Logic, Justification) යනුවෙන් යමක් ව්‍යවහාර කෙරේ නම් එයම පාලි සම්ප්‍රදාය තුළ අනුමානය වශයෙන් යොදා ගෙන ඇති බව පෙනේ.